# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,073 — 1960 මාර්තු 4 වැනි සිකුරාද — 4.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 53 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 53 | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 57 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## පළාත් පාලන නිවේදන

### නුවරඑළිය කඩවත් සතර ගම්කාර්ය සභාව

#### 1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනත

1951කේ අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 13 ඒ 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරී තැනවූද නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය කඩවත් සතර ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාවේ සභාපති තැන වූද එච්. පී. ඇස්. නානායක්කාර වන මම, 1960 වර්ෂයේදී මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනවලදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම්කාර්ය සභාවට අයත් ගම් ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

මාර්තු 5, 12, 20, 26.
අප්‍රියෙල් 3, 11, 18, 25.
මැයි 3, 10, 11, 17, 24.
ජූනි 2, 8, 15, 23.
ජූලි 1, 8, 15, 22, 31.
අගෝස්තු 6, 13, 21, 29.
සැප්තැම්බර් 4, 12, 20, 27.
ඔක්තෝබර් 4, 12, 19, 27.
නොවැම්බර් 2, 11, 18, 25.
දෙසැම්බර් 2, 11, 17, 24.

එච්. පී. ඇස්. නානායක්කාර,
නුවරඑළිය කඩවත් සතර ගම් කාර්ය සභාපති.

වෂ් 1960ක් වූ පෙබරවාරි මස 23 වැනි දින, නානුඔය පිහිටි නුවරඑළිය කඩවත් සතර ගම්කාර්ය කාර්යාලයේදීය.

---

## තනතුරු—ඇබෑර්තු

**ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි**

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥාපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධන වලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරු ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සෙවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයකට හෝ දෙවර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් සවකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැතිනම්, අවුරුදු 2ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ට" නියම කරනු ලැබෙයි.

(iii) (අ) සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී තනතුරුවල ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී.

සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන්ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඇතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදුතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නාමයට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු————, මාස————, දින————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස. මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—
(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.
(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.
(iii) විශ්‍රාම වැටුප් සහිත ද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :————.
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.

13. **විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි සවභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණී. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### වින්නඹු සේවිකා තනතුරු

පළාත් පාලන වින්නඹු සේවිකා සේවයේ පුරප්පාඩු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරුවලට අයත් වාර්ෂික වැටුප් රු. 666න් පටන් ගෙන වර්ෂයකට රු. 42 බැගින් 15 වරක් වැඩිවී රු. 1,296 තෙක් නගී. එහි රු. 1,044 වාර්ෂික වැටුපට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩයිමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්**—

(අ) වයස: 1960 මාර්තු මස 18 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි;

(ආ) අයදුම්කරුවෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගේ දක්ෂතා පිළිබඳ සහතික දරණ ලියාපදිංචි වූ වින්නඹු සේවිකාවෝ විය යුතුයි. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහලෙන් හා දෙමළෙන් කතා කළ හැකි අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1960 මාර්තු මස 18 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස පහත අත්සන් කරන අයගේ පෞද්ගලික නමට නොවේ.

6. අයදුම් පත්‍රවලට අමුනා එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් ලිපි නොවේ. පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ.

7. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන සභාපති.

1960 පෙබරවාරි මස 25 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

---

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ i වැනි ශ්‍රේණියට අයත් ආයුර්වේද වෛද්‍ය තනතුරක්

පළාත් පාලන සේවයේ i වැනි ශ්‍රේණියට අයත් ආයුර්වේද වෛද්‍ය තනතුරක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :—**

වර්ෂයකට රුපියල් 2,100-15×120 සහ 1×180-රු. 4,080. එහි රු. 2,820 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) අයදුම්කරුවෝ, 1949 අංක 49 දරණ ස්වදේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබුවෝ විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයයේ ස්වදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍යකර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ ලංකාවේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක වඩා උසස් සහතිකයක් හෝ තිබිය යුතු අතර, ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස අවුරුදු 10 කට නොඅඩු කාලයක් වෛද්‍ය කර්මයෙහි යෙදී සිටි පළපුරුද්ද තිබිය යුතුයි. 1953 සැප්තැම්බර් මාසයෙන් පසු අවසාන පරීක්ෂණයෙන් සමත් වී අලුත් අධ්‍යයන පරිපාටිය සම්පූර්ණ කළ ඩී. අයි. ඇම්. සහ ඇස් (ලංකා), උපාධිධරයින් සම්බන්ධයෙන් ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු පළපුරුද්ද තිබීම අවශ්‍ය නොවේ.

(ඇ) සුප්‍රසිද්ධ ගුරු වෛද්‍යවරයකු යටතේ යටත් පිරිසෙයින් පස් වර්ෂයක ශිෂ්‍යභාවයෙහි යෙදී සිටීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස වර්ෂ 15 කට නොඅඩු කාලයක් තුළ කරන ලද ව්‍යාප්ත වෛද්‍ය අභ්‍යාසයක් ඇති පිළිගත් සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයන්ගේ ඉල්ලුම් පත්‍රද මීට ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍ර සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගෙන් සහ ගුරු වෛද්‍යවරයාගෙන් ලබාගත් සහතිකද ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුත්තාහ.

(ඈ) මේ තනතුර සඳහා ඉල්ලුම් කර සිටින පළාත් පාලන සේවා දෙවැනි ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍යවරුන් කෙරෙහි වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

4. තෝරාගනු ලැබූ අයදුම්කරුට පෞද්ගලික වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැත. තමා සේවය කරන ආයුර්වේද බෙහෙත් ශාලාව ආසන්නයෙහි පදිංචි වන ලෙස ඔහුට නියම කරනු ඇත.

5. අයදුම්කරුවෝ ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලිපි පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ දිවුරුම්පෙත්සම් නොපිළිගනු ලැබේ).

(ආ) සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීමේ පළපුරුද්ද පිළිබඳව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියාගේ සහතිකය (එහි පළපුරුද්ද පිළිබඳ කාල පරිච්ඡේදය සඳහන් විය යුතුයි).

6. මේ ගැසට් පත්‍රයේ (හතර වැනි කොටසේ) ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට 1960 මාර්තු මස 19 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත (පෞද්ගලික නමට නොවේ) ලැබෙන සේ එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි පහත සඳහන් ශීර්ෂයන් යටතේ දැක්වෙන කරුණු වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යොදාගත යුතුයි :—

(9) (ඊ) දැනට කරන රක්ෂාව :————.

(i) දැනට දරන තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට මුලින් පත්වූ දිනය දෙන්න :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන ආයතන යටතේ සේවය කොට ඇත් නම් ඒ පිළිබඳ සේවා සටහන :————.

(11) (ඒ) ආයුර්වේදය පිළිබඳ සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

(බී) ඒ සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නම :————.

(සී) සුදුසුකම් ලැබූ දින :————.

(ඩී) 1949 අංක 49 දරණ ස්වදේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ ලේඛනයෙහි හෝ සාමාන්‍ය ලේඛනයෙහි ලියාපදිංචි වූ අංකය :————.

(12) (i) සුදුසුකම් ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීම ආරම්භ කළ දිනය (එය සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අමුනන්න :————.

(ii) ආයුර්වේදයේ එක්තරා අංශයක් විශේෂයෙන් අධ්‍යයනය කළේද? එසේ නම් විස්තර දක්වන්න :————.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ස්වකීය ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයන්ට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයි නම් එය නැතිවී යන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන සභාපති.

1960 පෙබරවාරි 26 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

## පළාත් පාලන සේවය

### මීටර් කියවන්නකුගේ තනතුර (ජල කර්මාන්ත) (ආර්)

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප් ක්‍රමය.—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 750න් පටන් ගෙන වර්ෂයකට රු. 42 බැගින් 17 වරක් වැඩිවී රු. 1,464 දක්වා නගී. එහි රු. 1,128 වාර්ෂික වැටුප පළමු කාර්යක්ෂමතා කඩයිමක් ඇත්තේ ය. තෝරා ගනු ලබන අයදුම්කරුට පළමු වැනි වැටුප් වැඩිවීම ගෙවන්නට ප්‍රථම ලංකා කාර්මික විද්‍යාලයයේ ඊයම් කර්මාන්තය පිළිබඳ සහතිකය ලබා ගැනීමට නියම කරනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්

(අ) වයස :— 1960 මාර්තු 18 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් සමත්ව, සිටිය යුත්තාහ.

4. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1960 මාර්තු මස 18 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම්පත්‍රය ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන සභාපති.

1960 පෙබරවාරි 29 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී.—ජී. බී. 14/23/2.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ගම් ප්‍රදේශයේ ගම්කායීසී සභාව විසින් සම්පාදිතව, 1959 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960වේ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

**රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා**

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නා වූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත දක්වෙන "ඒ" උපලේඛනයෙහි සඳහන් පෝරමයෙහි ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම කාර්ය සභා කාර්යාලයෙන් ලබා ගත හැක.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1960 වෙනි වර්ෂය වෙනුවෙන් (1) වෙනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1960 පෙබරවාරි මස 29 වෙනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමාවෙත යැවිය යුතුයි.එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිය භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ එයිට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම් දෙනු ලැබීමක් නොමැතිව—

(අ) උපලේඛනයෙහි සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1960 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයෙහි සඳහන් කරනලදුව එකී වර්ෂයේ දවස් 30 ට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස 31 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපණත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ ඉහතින් සඳහන් අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත්ව යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත් පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත් පත් කරගැනීමේ හෝ තබාගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුලතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝරමය ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දන්වීම කින් එසේ අත් පත් කරගත් බව තව දුරටත් ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව තුන්වෙනි ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් ලේඛණය සැපයුවාවූ සෑම අයෙක්ම, එකී ලේඛණය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛණයේ සඳහන් කරණු ලැබ තමාට අයිතිව හෝ තමා භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුලතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛණය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසායයි දක්වෙන ලියවිල්ලකින්වූ දන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ (3) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛණය ;හෝ සැපයුවාට පසු ඒ රථවාහන හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතරකලාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතරකළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් යම් කිසි රථවාහනයක් සඳහා බද්ද ගෙවූවිට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මීට යාකොට ඇති "බී" උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට

ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කන්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ අංකයද සඳහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුය. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩු අයිති කාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත 50ක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබා ගැනීමට අයිති වාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ හොරා ගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකය කින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත 50 ක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහන අයිතිකරුවෙකු විසින් හෝ භාරකරු විසින් (6) වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ ඕනෑම පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි (7) වෙනි අතුරු ව්‍යවස්ථා වෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යනුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී අනෙක් නිලධාරියා විසින් හෝ ඉල්ලීමක්කර සිටින කල්හි, එකී ඕනෑම රථයක් භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ඔහුට හෝ එකී තහඩුව පරීක්ෂා කිරීමට ඉඩදිය යුතුයි.

9. අම්බලංගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1941කේ මාර්තු මස 7 වෙනි දින අංක 8,722 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද රථවාහන හා සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථා කරන්දෙණිය ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාවට පමණක් අදාල වන පරිද්දෙන් මෙයින් අවලංගුකර සිටිනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුයෙන් ගාලු දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරණු ලැබේ.

"ආඥාපනත" යනුයෙන් ගම්සභා ආඥාපනතේ (198 පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝරමය

### කරන්දෙනිය ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ උප ලේඛනයයි..

අයිතිකාරයාගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශයේ අංකය :————.

ගම :————.

| රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ විස්තරය | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... | | |
| ජින්රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් ... | | |
| අලි ... | | |
| අශවයෝ ... | | |
| අශවතරයෝ ... | | |
| බූරුවෝ ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ප්‍රකාශය සෑම අතින්ම සත්‍ය බවට මම මෙයින් සහතික කරමි.

————.
අයිතිකරුගේ අත්සන.

දිනය :————

* නුවුවමනා වචන කපා හරිනු.

## "බී" උපලේඛනය

| | | |
|---|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... | ... | ක. ග. ර. |
| සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... | ක. ග. ක. |
| සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... | ක. ග. ත. |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා | ... | ක. ග. රි. |
| සෑම අත් කරත්තයක් සඳහා | ... | ක. ග. අ. |
| සෑම බයිසිකලයක් සඳහා ... | ... | ක. ග. බ. |

---

## ගම්සභා ආඥාපනත

ගම් සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ බදුලු දිස්ත්‍රික්කයේ දඹගල්ල-මහ වැදිරට-නිකවැටිය ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් සංශොධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කායසීංශයේ ස්ථාවර ලේකම් තැන.

1960වේ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථාව

1948වේ දෙසැම්බර් මස 10 වැනි දින අංක 9,928 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථා, එහි 105 වැනි අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ, අවසානයට පහත සඳහන් අළුත් කාරණ එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"කම්මලක් තබා ගැනීම,

බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහා වැඩ පොළක් තබා ගැනීම,

ගෘහ භාණ්ඩ සෑදීම".

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය **අවසන් වේ.**

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, **සුප්‍රිම්** උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරනු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. **දායක මුදල් :—**

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.